**අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2012**

---

අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 44 දරන අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම.**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

**1.4** අහිතකර මතය සඳහා පදනම

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැළපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහෝමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2.** මූල්‍ය ප්‍රකාශන.

----------------

**2.1** අහිතකර මතය

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

**2.2.1** ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

අම්බුළුවාව භාර අරමුදලේ සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන සමඟ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

ක්‍රමවත් ගිණුම්කරණ පද්ධතියක් ක්‍රියාත්මක නොවීම මූලික මූලාශ්‍ර ලේඛන, නියමිත උපයෝගී පොත් හා වාර්තා පවත්වා නොගැනීම හේතුවෙන් කරන ලද නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ පහත දැක්වෙන කරුණු මත ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විශ්වාසය තැබීම විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(අ) 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුල මහා භාරකාර අරමුදලින් චෙක්පත් මගින් අරමුදල වෙත ලබාදී තිබූ රු.13,619,222 ක මුදල් ගිණුම්වලින් අත්හැරීම හා එම මුදල් වියදම් කළ ආකාරය පෙන්නුම් නොකිරීම.

(ආ) වර්ෂය තුළදී ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දරන ලද රු.13,049,811 ක ප්‍රාග්ධන ස්වරූපයේ වියදමක් අයභාර වියදමක් ලෙස ගිණුම්ගතකර තිබීම.

(ඇ) දූරකථන කුළුණු ඉදිකිරීම සඳහා පරිශ්‍රයේ පහසුකම් සැපයීම වෙනුවෙන් පෞද්ගලික දූරකථන සමාගමක් සමඟ වූ ගිවිසුම ප්‍රකාරව 2010 ජූනි සිට 2015 ජූනි දක්වා මසකට රු. 54,000 ක මාසික කුලියකට ලබාදී තිබුණද කාල පරිච්ඡේදයට අදාළ කිසිදු මුදලක් ලද බවට හෝ ලැබිය යුතු බවට ගිණුම් මඟින් අනාවරණය නොවීම.

(ඇ) තවත් පෞද්ගලික දුරකථන සමාගමක් වෙතද දුරකථන කුළුණු පහසුකම් සැපයීම කර තිබුණද එම අදාළ ගිවිසුම විගණනයට ඉදිරිපත් නොවීමෙන් හා ගිණුම් මඟින් ලැබූ ආදායම් පෙන්නුම්කර නොතිබීමෙන් මෙම මුදල් ලැබුණේද නැතිනම් අවභාවිතයට යෙදුනේද යන්න නිශ්චය කළ නොහැකිවීම.

(ඉ) මහා භාරකාරවරයාගෙන් විගණනය වෙත ලැබී තිබූ ශේෂ සනාථකිරීම් අනුව අරමුදලේ මූලධන සහ අයභාර වියදම් වෙනුවෙන් පිළිවෙලින් රු. 2,000,000 ක් සහ රු.20,109,170 ක් වැයකර ඇති බවත් එම මුදල භාරකාර අරමුදලට අයවිය යුතුව ඇති බවත් සනාථකර ඇතත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව එවැනි තත්ත්වයක් පෙන්නුම්කර නොතිබීම.

(ඊ) මහාභාරකාර අරමුදලින් අරමුදල වෙත ලබාදී තිබූ මුදල් අරමුදලට ලබාදීම වෙනුවට අරමුදලේ සභාපතිවරයාගේ වෛද්‍ය පහසුකම්, ගුවන් ටිකට්පත්, නවාතැන් ගාස්තු සඳහා ගෙවූ රු.4,251,044 ක් හා සිංගප්පූරු ඩොලර් 13,112 ක් සම්බන්ධයෙන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර නොතිබීම.

(උ) මහාභාරකාරවරයා විසින් සමාලෝචිත වර්ෂයේදී රු.4,000,000 කට මෝටර්රථයක් පෞද්ගලික ආයතනයකින් මිලටගෙන එය අරමුදලට ලබාදී ඇතත් එය ගිණුම මගින් පෙන්නුම් නොකෙරෙන අතර එවැනි වාහනයක් අරමුදල සතුව නොපවතින බව නිරීක්ෂණය වීම.

(ඌ) ඉකුත් වර්ෂවලදී ජෛව විවිධත්ව භාරයේ ඉදිකර ඇති රු.6,670,000 ක් වටිනා ගොඩනැගිලි 03ක් ගිණුම්ගත කර නොතිබීම.

(එ) අම්බුළුවාව අරමුදල වෙනුවෙන් මහා භාරකාරවරයා විසින් 2009 ඔක්තෝබර් 25 දින ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර තිබුණු රු.15,000,000 ක ස්ථාවර තැන්පතුව වෙනුවෙන් ලැබිය යුතු රු.2,375,000 ක පොළිය ගිණුම්ගත කර නොතිබීම.

(ඒ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණු රු.1,213,336 ක උද්‍යාන සේවක වැටුප්, ඉදිකිරීම් වැටුප් හා උද්‍යාන අලංකරණ වියදම් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබීම.

(ඔ) සමාලෝචිත වර්ෂය තුළ සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ එකතුව රු.274,168 ක් වූ දායක මුදල් ගිණුම්ගත කර නොතිබීම

(ඕ) අම්බුළුවාව ජෛව විවිධත්ව ඒකකයට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වතුර මෝටර් 04 ක්, අත්ට්‍රැක්ටර් එංජිමක් සහ ජෙනරේටරයක් යන වත්කම්වල වටිනාකම අගයකර ගිණුම්ගත කර නොතිබීම.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ සහ ආදායම් හා වියදම් ප්‍රකාශනයේ දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියේ දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකිවිය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගෘහ භාණ්ඩ | 1,500,000 | i. උපලේඛණ<br>ii. භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| බැංකු මුදල් | 2,825,869 | බැංකු සහතිකය |
| ස්ථාවර වත්කම් | 333,679,802 | ස්ථාවර වත්කම් ලේඛණ |
| කුළුණු ආදායම | 5,802,000 | i. රිසිට්පත්<br>ii. ආදායම් ලේඛණය |

**2. 3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණය භාර අරමුදලේ පාලක මණ්ඩලයේ 2009 ඔක්තෝබර් 02 දිනැති රැස්වීම් වාර්තාවේ තීරණ අංක I | සමාලෝචිත වර්ෂයේදී පාලක මණ්ඩල රැස්වීම් 12ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණේ එක් රැස්වීමක් පමණි. |
| (ආ). 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ, | |
| 04.3 වගන්තියේ සිට (අ) සිට (ඉ) දක්වා උප වගන්ති | විගණකාධිපතිවරයා වෙත මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් වියයුතු කාර්යය සාධන වාර්තා, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සමුච්චිත අරමුදලේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය, මූලික ගිණුම් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල්රෙගුලාසි 395 | මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (ii). මුදල්රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

(ඇ). 2009 ජූනි 09 දින අංක ඩීඑම්ජ්/2009/(01) දරන ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. කළමනාකරණ විගණන චක්‍රලේඛය

3. මූල්‍ය සමාලෝචනය
-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල.
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,474,810 ක ඌනතාවයක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,445,389 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,920,199ක පිරිහීමක් දක්නට ලැබුණි.

3.2 ආදායම් පරිපාලනය
----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). සංචාරකයන් ආකර්ශනය කරවාගත හැකි ඉතා ආකර්ශණීය දර්ශන පථයකින් යුතු අම්බුළුවාව මහනුවර නුවරඑළිය මාර්ගයට මායිම්ව පිහිටා තිබුණත් සමාලෝචිත වර්ෂයේ විදේශීය සංචාරකයින් පැමිණ තිබුණේ 1,225 දෙනෙකු පමණක් වූ අතර උපයාගත් ආදායම රු.367,500 ක් වීම හේතුවෙන් ආකර්ෂණීය තත්ත්වයෙන් ප්‍රයෝජනයක් ලැබී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) රජයේ ප්‍රදාන රු. 10,500,000 ක වැයකර ඉදිකළ සියළු පහසුකම් සහිත සංචාරක නිවාස 02 ක් අරමුදල සතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ආදායම් ලෙස උපයාගෙන තිබුණේ රු. 54,000 ක් පමණි.

4. මෙහෙයුම් සමාලෝචනය.
----------------------------

4.1 මතභේදයට තුඩුදුන් ගනුදෙනු.
----------------------------------

JM – 2770 දරන ටොයාටා ලැන්ඩ්කෲෂර් ජීප්රථය විකිණීම.
-----------------------------------------------------------------

අම්බුළුවාව අරමුදල විසින් 2011 වර්ෂයේ ජාතික ජලසම්පාදන ජලාපවහන මණ්ඩලයෙන් රු.3,431,400 කට මිලදීගත් ටොයොටා ලැන්ඩ් කෲෂර් ජීප්රථය ධාවනයට නුසුදුසු හෙයින් විකිණීමට ඉල්ලමින් අග්‍රාමාත්‍ය සම්බන්ධීකරණ ලේකම්වරයෙකු 2012 ජනවාරි 20 දින මහා භාරකාරවරයාගෙන් සිදුකළ ඉල්ලීමට අනුව මිලගණන් කැඳවා විකිණීමට අනුමත කර තිබුණ නමුත් වාහනය පිළිබඳ තක්සෙරුවක් ලබාගැනීම හෝ පිළිගත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව 2012 ජනවාරි 26 දින රු.3,400,000 කට ජීප් රථය අලෙවිකර තිබුණි.

**4.2** කළමනාකරණ අකාර්යක්ෂමතා.

ජයවැව පුළුල්කිරීමේ කර්මාන්තය පුළුල් මහජන තරඟයකට යොමුකිරීම තුලින් කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණු අතර කොන්ත්‍රාත් නිම කිරීමෙන් පසු තාක්ෂණික නිලධාරියෙකුගේ මිනුම්පත්, බිල්පත් නොමැතිව රු.1,206,159 ක මුදලක් ගෙවා තිබුණි.

**4.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.1,761,920ක් වටිනා භාණ්ඩ ලැබීම් හා නිකුත්කිරීම් තොග පොත්වල සටහන් කර නොතිබුණි.

**4.4** හඳුනාගත් පාඩු

රජයේ ප්‍රදාන රු.1,800,000 ක් යොදා ඉදිකළ කැපටේරියා අවන්හල ඊට ලබාගත් ගෘහ භාණ්ඩද සමඟ බාහිර පාර්ශවයන් වෙත ව්‍යාපාරික කටයුතු කරගෙන යාම සඳහා ලබාදී තිබුණ නමුත් එමගින් ආදායම් ලැබී නොතිබුණි.

**4.5** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අම්බුළුවාව පිවිසුම් දොරටුව අසල රු.1,270,000ක් වියදම් කරමින් ඉදිකළ කඩකාමර 03ක් වසාදමා තිබුණු අතර, ඉන් ඵලදායී ආදායමක් උපයාගැනීමට අවධානය යොමුකර නොතිබුණි.

(අ) රජයේ ප්‍රදාන රු.10,000,000 ක් භාවිතා කරමින් ඉදිකළ අංග සම්පූර්ණ සම්මන්ත්‍රණ ශාලාවක් අරමුදල සතු වුවත්, එය ඌන උපයෝජිතව පැවැතීම හේතුවෙන් ජරාවාස වෙමින් පැවතුණි.

**5.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**5.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුළත අරමුදල් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ප්‍රමාදය වසර 01කි.

**5.2** කාර්යසාධනය.

අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණය භාර අරමුදලේ 2009 අංක 44 දරන පනතේ 4 වගන්තියේ (අ) සිට (ක) වූ අරමුණු 20න් අරමුණු 03ක් හැරුණුවිට අනෙකුත් පරිබාහිර අරමුණු ඉටුකිරීම සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**5.3** **අයවැය පාලනය.**

**-------------------**

**සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.**

**5.4** **ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------**

**අරමුදලේ මිලදීගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.**

**6.** **පද්ධති හා පාලනයන්**

**------------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුයි.**

**(අ).** **ආදායම් පරිපාලනය.**

**(ආ).** **අභ්‍යන්තර පාලනය.**

**(ඇ).** **ගිණුම්කරණය.**